# මාසික වෙළඳ විවරණිකාව

ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව


ශ්‍රී ලංකා මහ බැංකුව

**2022 මාර්තු**


**04 වෙළුම 03 නිකුතුව**

## විශේෂ සිදුවීම්

### මාසික අපනයන ක්‍රියාකාරිත්වය





### මාසික ආනයන ක්‍රියාකාරිත්වය





2022 වසරේ මාර්තු මාසය තුළ දී වෙළඳ භාණ්ඩ අපනයන ආදායම එ.ජ.ඩොලර් මිලියන 1,057ක් දක්වා පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 3.4කින් පහළ ගියේය.

2022 වසරේ මාර්තු මාසය තුළ දී වෙළඳ භාණ්ඩ ආනයන වියදම එ.ජ.ඩොලර් මිලියන 1,819ක් දක්වා පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 5.6කින් පහළ ගියේය.

### අපනයන හා ආනයන වර්ධන අනුපාත (%)





### වෙළඳ හිඟය (එ.ජ. ඩොලර් මිලියන)




2022 වසරේ පළමු කාර්තුව තුළ දී අපනයන ආදායම සහ ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව, පිළිවෙළින්, සියයට 9.0කින් සහ සියයට 12.1කින් ඉහළ ගියේය.


වෙළඳ ගිණුමේ හිඟය, 2021 වසරේ මාර්තු මාසයේ දී පැවති එ.ජ. ඩොලර් මිලියන 832ට සාපේක්ෂව, 2022 වසරේ මාර්තු මාසයේ දී එ.ජ. ඩොලර් මිලියන 762ක් දක්වා අඩු විය.

## ප්‍රධාන අපනයන හා ආනයන කාණ්ඩ - (2022 ජන.- මාර්තු)




# අපනයන ක්‍රියාකාරිත්වය

### අපනයන ක්‍රියාකාරිත්වය - (ජන.-මාර්තු)




### අපනයන පරිමා හා මිල දර්ශක (ජන.-මාර්තු)





2022 වසරේ පළමු කාර්තුව තුළ දී, ප්‍රධාන වශයෙන් කාර්මික අපනයන ඉහළ යැම හේතුවෙන් අපනයන ආදායම ඉහළ ගියේය. එසේ වුවත්, කෘෂිකාර්මික සහ ඛනිජමය අපනයන පහළ යැමක් වාර්තා කළේය.


2022 වසරේ පළමු කාර්තුව තුළ දී, අපනයන පරිමා දර්ශකය පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 9.1කින් ඉහළ ගිය අතර, අපනයන මිල දර්ශකය සියයට 0.2කින් පහළ ගියේය.

## කෘෂිකාර්මික අපනයන


### කෘෂිකාර්මික අපනයන ආදායම





### කෘෂිකාර්මික අපනයන පරිමා හා මිල දර්ශක




### කෘෂිකාර්මික අපනයනවල ක්‍රියාකාරිත්වය (ජන.-මාර්තු)





### තේ සහ රබර් මිල ගණන් *





2022 වසරේ පළමු කාර්තුව තුළ දී, තේ, කුළුබඩු සහ සකස් නොකළ දුම්කොළ අපනයන ආදායම පහළ යැමත් සමඟ කෘෂිකාර්මික අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සැලකිය යුතු ලෙස පහළ ගියේය. කෙසේ වුවත්, මෙම කාලපරිච්ඡේදය තුළ දී, මුහුදු ආහාර, පොල්, රබර් සහ සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත ඉහළ අපනයන ආදායම් වාර්තා කළේය.

# කාර්මික අපනයන


### කාර්මික අපනයන ආදායම





### කාර්මික අපනයන පරිමා හා මිල දර්ශක




### කාර්මික අපනයනවල ක්‍රියාකාරිත්වය (ජන.-මාර්තු)





### නැව් හා ගුවන් යානා ඉන්ධනවල අපනයන මිල ගණන්





2022 වසරේ පළමු කාර්තුව තුළ දී කාර්මික අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව ඉහළ ගිය අතර, මේ සඳහා ප්‍රධාන වශයෙන්, රෙදිපිළි හා ඇඟලුම්, ඛනිජතෙල් නිෂ්පාදිත, මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ, සහ මූල ලෝහ හා උපාංග අපනයන ආදායම ඉහළ යෑම හේතු විය. කෙසේ වුවත්, මෙම කාලපරිච්ඡේදය තුළ දී රබර් නිෂ්පාදිත, ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත, රසායනික නිෂ්පාදිත සහ පිහන් මැටි නිෂ්පාදිත අපනයන ආදායම පහළ ගියේය.

# ආනයන ක්‍රියාකාරිත්වය

### ආනයන ක්‍රියාකාරිත්වය - (ජන.-මාර්තු)





### ආනයන පරිමා හා මිල දර්ශකය (ජන. -මාර්තු)





අන්තර් භාණ්ඩ සහ ආයෝජන භාණ්ඩ ආනයන වියදම් ඉහළ යෑම හේතුවෙන්, පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව 2022 වසරේ පළමු කාර්තුව තුළ දී, වෙළඳ භාණ්ඩ ආනයන වියදම ඉහළ ගියේය. මේ අතර, මෙම කාලපරිච්ඡේදය තුළ දී, පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව ආනයන පරිමා දර්ශකය සියයට 4.7කින් පහළ ගිය අතර, ආනයන මිල දර්ශකය සියයට 17.6කින් ඉහළ ගියේය.

# පාරිභෝගික භාණ්ඩ ආනයන


පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම





පාරිභෝගික භාණ්ඩ ආනයන පරිමා හා මිල දර්ශක




පාරිභෝගික භාණ්ඩ ආනයනවල ක්‍රියාකාරිත්වය
(ජන. -මාර්තු)





සීනි, පරිප්පු සහ කිරිපිටි සඳහා වූ
ආනයන මිල ගණන් වල සාමාන්‍ය





ප්‍රධාන වශයෙන්, විදුලි සංදේශ මෙවලම් ඇතුළු ආහාර නොවන පාරිභෝගික භාණ්ඩවල ආනයන වියදම පහළ යෑම හේතුවෙන් 2022 වසරේ පළමු කාර්තුව තුළ දී, පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම පහළ ගියේය. තවද, සීනි හා රසකැවිලි සහ තෙල් හා මේද ආනයන වියදමෙහි පහළ යෑමක් දක්නට ලැබුණි. කෙසේ වුවත්, මෙම කාලපරිච්ඡේදය තුළ දී, ධාන්‍ය හා ඇඹරුම් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත (ප්‍රධාන වශයෙන් සහල්), බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත, රෙදිපිළි හා උපාංග සඳහා වන ආනයන වියදම් ඉහළ අගයක පැවතිණි.

# අන්තර් භාණ්ඩ ආනයන


අන්තර් භාණ්ඩ ආනයන වියදම





අන්තර් භාණ්ඩ ආනයන පරිමා හා මිල දර්ශක



අන්තර් භාණ්ඩ ආනයන ක්‍රියාකාරිත්වය (ජන.-මාර්තු)




බොර තෙල් හා පොහොර ආනයන මිල ගණන් (මාසික සාමාන්‍ය අගයන්)





*2021 වසරේ මාර්තු, ජූනි,සැප්තැම්බර්, නොවැම්බර් මාසවල සහ 2022 වසරේ මාර්තු මාසයේ බොරතෙල් ආනයනය කර නැත.


ප්‍රධාන වශයෙන්, ඉන්ධන, රෙදිපිළි හා රෙදිපිළි උපාංග, මූල ලෝහ, ඛනිජමය නිෂ්පාදිත සහ කඩදාසි, සන කඩදාසි හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත ආනයන වියදම ඉහළ යෑම හේතුවෙන්, 2022 වසරේ පළමු කාර්තුව තුළ දී අන්තර් භාණ්ඩ ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. කෙසේ වුවත්, ආහාර සැකසුම්, පොහොර, තිරිඟු සහ කෘෂිකාර්මික යෙදවුම් ආනයන වියදම පහළ ගියේය.

## ආයෝජන භාණ්ඩ ආනයන


ආයෝජන භාණ්ඩ ආනයන වියදම




ආයෝජන භාණ්ඩ ආනයන පරිමා හා මිල දර්ශක




ආයෝජන භාණ්ඩ ආනයන ක්‍රියාකාරිත්වය (ජන.-මාර්තු)




ගොඩනැගිලි ද්‍රව්‍ය සහ යන්ත්‍රසූත්‍ර හා උපකරණ ආනයන ඉහළ යෑම හේතුවෙන් 2022 වසරේ පළමු කාර්තුව තුළ දී ආයෝජන භාණ්ඩ ආනයන වියදම ඉහළ ගියේය. කෙසේ වුවත්, මෙම කාලපරිච්ඡේදය තුළ දී, ප්‍රවාහන උපකරණ ආනයන වියදම පහළ ගියේය.

# විදේශීය වෙළඳාම - සාරාංශය (අ)

## අපනයන ක්‍රියාකාරිත්වය (එ.ජ. ඩොලර් මිලියන)

| | | මාර්තු- 2021 | මාර්තු - 2022 | වෙනස (%) | ජන. -මාර්තු 2021 | ජන.-මාර්තු 2022 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|---|
| **කෘෂිකාර්මික අපනයන** | | **257.3** | **199.3** | **-22.6** | **663.8** | **605.9** | **-8.7** |
| එයින් | තේ | 124.6 | 94.7 | -24.0 | 338.1 | 286.8 | -15.2 |
| | පොල් | 41.2 | 36.7 | -10.9 | 96.3 | 104.7 | 8.8 |
| | කුළුබඩු | 38.6 | 23.2 | -39.8 | 113.8 | 85.3 | -25.0 |
| | මුහුදු ආහාර | 25.4 | 22.4 | -11.6 | 56.4 | 67.7 | 20.1 |
| **කාර්මික අපනයන** | | **829.8** | **853.9** | **2.9** | **2,302.4** | **2,627.8** | **14.1** |
| එයින් | රෙදිපිළි හා ඇඟලුම් | 467.2 | 464.4 | -0.6 | 1,333.5 | 1,477.0 | 10.8 |
| | රබර් නිෂ්පාදිත | 95.2 | 81.3 | -14.5 | 256.3 | 251.7 | -1.8 |
| | ඛනිජතෙල් නිෂ්පාදිත | 28.8 | 55.5 | 93.1 | 85.8 | 179.5 | 109.2 |
| | ආහාර, පාන වර්ග හා දුම්කොළ | 51.0 | 46.6 | -8.6 | 132.4 | 138.7 | 4.8 |
| | යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 44.2 | 44.3 | 0.2 | 124.9 | 133.8 | 7.1 |
| | මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ | 27.7 | 38.3 | 38.3 | 70.8 | 93.7 | 32.3 |
| | සම්භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් | 3.2 | 6.9 | 114.3 | 11.2 | 17.0 | 52.4 |
| **ඛනිජ හා වෙනත් අපනයන** | | **6.7** | **3.7** | **-45.1** | **16.0** | **15.6** | **-2.7** |
| **මුළු අපනයන** | | **1,093.8** | **1,056.9** | **-3.4** | **2,982.2** | **3,249.3** | **9.0** |

## ආනයන ක්‍රියාකාරිත්වය (එ.ජ. ඩොලර් මිලියන)

| කාණ්ඩය | | මාර්තු- 2021 | මාර්තු - 2022 | වෙනස (%) | ජන. -මාර්තු 2021 | ජන.-මාර්තු 2022 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|---|
| **පාරිභෝගික භාණ්ඩ** | | **379.6** | **282.0** | **-25.7** | **997.9** | **940.8** | **-5.7** |
| ආහාර හා පාන වර්ග | | 189.7 | 163.9 | -13.6 | 505.3 | 512.5 | 1.4 |
| එයින් | එළවළු (ආ) | 43.4 | 28.1 | -35.3 | 111.1 | 90.6 | -18.4 |
| | සහල් | 1.2 | 28.6 | 2245.6 | 2.9 | 118.1 | 3934.0 |
| වෙනත් ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ | | 189.9 | 118.1 | -37.8 | 492.6 | 428.3 | -13.1 |
| එයින් | පෞද්ගලික රථවාහන | 1.0 | 0.7 | -30.7 | 2.4 | 2.1 | -14.5 |
| **අන්තර් භාණ්ඩ** | | **1,129.9** | **1,177.8** | **4.2** | **2,990.7** | **3,610.1** | **20.7** |
| එයින් | ඉන්ධන | 347.2 | 519.8 | 49.7 | 977.2 | 1,412.3 | 44.5 |
| | රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 250.9 | 240.8 | -4.0 | 710.2 | 880.5 | 24.0 |
| | පොහොර | 16.3 | 14.9 | -8.4 | 35.0 | 21.6 | -38.3 |
| | තිරිඟු හා ඉරිඟු | 31.1 | 24.2 | -22.1 | 93.5 | 81.7 | -12.6 |
| **ආයෝජන භාණ්ඩ හා වෙනත්** | | **416.5** | **359.1** | **-13.8** | **1,052.5** | **1,100.4** | **4.5** |
| එයින් | යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 274.6 | 227.2 | -17.3 | 685.1 | 695.2 | 1.5 |
| **මුළු ආනයන** | | **1,925.9** | **1,818.9** | **-5.6** | **5,041.1** | **5,651.2** | **12.1** |

## වෙළඳ ශේෂය (එ.ජ. ඩොලර් මිලියන)

| කාණ්ඩය | මාර්තු- 2021 | මාර්තු - 2022 | වෙනස (%) | ජන. -මාර්තු 2021 | ජන.-මාර්තු 2022 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **වෙළඳ ශේෂය** | -832.2 | -762.1 | | -2,059.0 | -2,402.0 | |

## වෙළඳ දර්ශක හා වෙළඳ මිල අනුපාතය (2010 = 100) (ඇ)

| කාණ්ඩය | | මාර්තු- 2021 | මාර්තු - 2022 | වෙනස (%) | ජන. -මාර්තු 2021 | ජන.-මාර්තු 2022 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|---|
| **අපනයන** | | | | | | | |
| | වටිනාකම් දර්ශකය | 152.2 | 147.1 | -3.4 | 138.4 | 150.7 | 9.0 |
| | පරිමා දර්ශකය | 167.9 | 165.2 | -1.6 | 146.1 | 159.4 | 9.1 |
| | මිල දර්ශකය | 90.7 | 89.1 | -1.8 | 94.7 | 94.6 | -0.2 |
| **ආනයන** | | | | | | | |
| | වටිනාකම් දර්ශකය | 172.4 | 162.8 | -5.6 | 150.4 | 168.6 | 12.1 |
| | පරිමා දර්ශකය | 196.0 | 158.3 | -19.2 | 171.1 | 163.0 | -4.7 |
| | මිල දර්ශකය | 87.9 | 102.8 | 16.9 | 87.9 | 103.4 | 17.6 |
| **වෙළඳ මිල අනුපාතය** | | 103.1 | 86.6 | -16.0 | 107.7 | 91.4 | -15.1 |

(අ) තාවකාලික

(ආ) පරිප්පු, ළූණු, අර්තාපල්, රනිල කුලයට අයත් එළවළු සහ වෙනත් එළවළු ඇතුළත් වේ.

(ඇ) එ.ජ. ඩොලර්වලින් ගණනය කරන ලද